# මානව සම්පත් සංවර්ධනය, අපේ මව්බිම හා කැලණි සරසවිය ඉදිරියේ ඇති මහා අභියෝගයක්

ඩබ්ලිව් ඒ. එස්. පෙරේරා

ජාතියක ඉදිරිගමනට හේතුසාධක වන ප්‍රධානම බලශක්තිය, සංවර්ධනය කරනු ලැබූ මානව සම්පතයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආසියා හා පැසිපික් කලාපයේ ආර්ථික හා සමාජ කටයුතු පිළිබඳ කොමිසන් සභාව අපේ කලාපයේ මානව සම්පත් සංවර්ධන කාර්යය භාරව කටයුතු කරයි. එකී කොමිසන් සභාව ද ස්වකීය ක්ෂේත්‍රයට අයත් කාර්යයන් ඉටු කරන්නේ එස්කැප් කලාපයේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධ වූ " ජකර්තා ක්‍රියාකාරී සැලැස්මේ" දක්වෙන නියමයන්ට අනුකූලවය. එම සැලසුම ක්‍රියාත්මක කිරීමේ වගකීම පාර්ලිමේන්තු පණතක් මගින් සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරනු ලැබ ඇත. " ජකර්තා ක්‍රියාකාරී සැලැස්මෙහි" විස්තර කෙරෙන ආකාරයට එක් අතකින් ආර්ථික හා සමාජ සංවර්ධනය නැංවීමේ කාර්ය භාරයට උරදෙන මානව සම්පතම අනික් අතින් සංවර්ධන ක්‍රියාවලියෙහි ප්‍රතිලාභියා බවද සඳහන්නේ ය. ඒ අනුව "මානව සම්පත" සංවර්ධනය නමැති ගමනට උපයෝගී කරගනු ලබන යානයද අපේක්ෂිත ගමනාන්තය ද බවට පත් වන්නේ ය.

ඉහත සඳහන් කොමිසන් සභාවේ අර්ථ නිරූපණය අනුව මානව සම්පත් සංවර්ධනයෙහි ප්‍රතිඵල තුනකි. පළමුවැන්න සංවර්ධනය වූ මානව සම්පතකින් සමන්විත වූ සමාජයක සියළු සාමාජිකයෝ පූර්ණ සේවා නියුක්තිය ලැබීමට හිමිකරුවෝ වෙති. දෙවනුව ඔවුනට විද්‍යාව හා තාක්ෂණය මගින් ලබාගත හැකි ඉහළම වරප්‍රසාද හිමිවේ. තුන්වනුව ඔවුන් උසස් මට්ටමක ජීවන පරිසරයකට හිමිකම් ලබති.

කැලණි සරසවිය පිහිටුවීමේ සත්කාර්යයට මුල් වූ හිමි පැවිදි උතුමෝ සම්බෝධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට දායකත්වය සැලසීමත්, මෙරට ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය නංවාලීමට කැප වීමත් සාධර්ම අතින් පිරිපුන් ගුණ ගරුක සමාජයක් බිහිකිරීම සඳහා වූ උපරිම දායකත්වය සැලසීමත් සඳහා වූ ප්‍රඥාණයෙන් යුක්ත මානව සම්පතක් බිහිකිරීමේ කාර්යය එම සරසවිය මගින් ඉටුවනු ඇතැයි බලාපොරොත්තු වූහ. එම බලාපොරොත්තුව ඉටු වී තිබේ ද යන්න පිළිබඳ සමාලෝචනයක යෙදීම ද මෙම සමරු ග්‍රන්ථයේ එක් අරමුණක් බව සංස්කාරක මණ්ඩලය විසින් පළ කර තිබීම නිසා මානව